2016.07.08

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

## සිංහල භාෂාව හා සාහිත්‍යය — 9 ශ්‍රේණිය

විභාග අංකය :..................................................... | කාලය පැය 02 යි

### I කොටස

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

* ඉරි ඇඳි පදයට වඩාත් සමීප අර්ථය සහිත පදය තෝරන්න.

01. අධ්‍යාපන ක්‍රියාවලිය තුළ යල්පැනගිය ඉගැන්වීම් ක්‍රමශිල්ප භාවිත කෙරේ.
(1) ඉතා නවීන (2) කාලයට නොගැළපෙන
(3) සැමදාටම ගැළපෙන (4) යල මහට ගැළපෙන

02. ලේකම්තුමා පැමිණි විට සභාවේ කලබැගෑනියක් ඇති විය.
(1) පිළිගැනීමක් (2) කරදරයක් (3) සංග්‍රහයක් (4) ආරවුලක්

03. අලුත් ව්‍යාපාරිකයාගේ දියුණුවට අකුල් හෙළන්නට ආයෝජකයෝ බලා සිටිති.
(1) බාධාකිරීමට (2) අකුල් කඩා දැමීමට (3) කරදර කිරීමට (4) උදව් කිරීමට

04. ඉහළ නිලධාරීන්ගේ ඇතැම් ක්‍රියාවලට සුදුහුණු ගෑමට පහළ නිලධාරීන් අකමැති ය.
(1) වර්ණ ආලේප කිරීමට (2) වැරදි වසන් කිරීමට
(3) වර්ණනා කිරීමට (4) ගුණ කථනයට

* වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

05. ග , ජ , ඩ , ද , බ අක්ෂර සිරස් ලෙසට හඳුන්වනුයේ,
(1) මහප්‍රාණ අක්ෂර ලෙසයි. (2) කණ්ඨජ අක්ෂර ලෙසයි.
(3) අල්පප්‍රාණ අක්ෂර ලෙසයි. (4) අඝෝෂ අක්ෂර ලෙසයි.

* නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පේළිය තෝරන්න.

06. (1) විශ්වාසය, නිස්චිත, නිශ්පල, විනිශ්චය (2) විශ්වාසය, නිශ්චිත, නිෂ්ඵල, විනිශ්චය
(3) විශ්වාසය, නිෂ්චිත, නිෂ්පල, විනිශ්චය (4) විස්වාසය, නිෂ්චිත, නිෂ්ඵල, විනිශ්චය

07. (අං) , (අඃ) අක්ෂර පිළිවෙළට නම් කරන විට,
(1) අනුස්වාරය, දෙතිතයි. (2) විසර්ගය, අනුස්වාරයයි.
(3) අනුස්වාරය, විසර්ගයයි. (4) බිංදුව හා අනුස්වාරයයි.

* හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

08. ජනාධිපතිවරයා විසින් ............................... කාර්යාලයට කැඳවනු ලැබූහ.
(1) තානාපතිවරු (2) තානාපතිවරුන්
(3) තානාපතිවරයෙක් (4) තානාපතිවරයෙකු

09. වේගයෙන් පැමිණි යාත්‍රා පෙළ වරායට ප්‍රවේශ ..............................

(1) වෙති. (2) වන ලදි. (3) වූවාය. (4) විය.

10. ........................ ක්‍රීඩා කරද්දී ඇතැම්හු ත්‍යාග සූදානම් කළහ.

(1) සමහරෙක් (2) සමහර අය (3) සමහරුන් (4) අයෙක්

* අකාරාදි පිළිවෙළට ගැළපීමේ දී නිවැරදි වන්නේ,

11. (1) ඉද්ද, පිච්ච, කඩුපුල්, රෝස. (2) කැවුම්, කිරිබත්, කේක්, කොකිස්.

(3) අක්කා, නංගී, නැන්දා, තාත්තා. (4) කළු, දම්, රතු, නිල්.

12. "ලියන ලදි" යන අතීත කාල ඒක වචන කර්ම කාරක ආඛ්‍යාත පදයේ, කර්තෘ කාරක, වර්තමාන කාල බහු වචන ආඛ්‍යාතය වන්නේ,

(1) ලියූහ. (2) ලියනු ලබති. (3) ලියන ලදහ. (4) ලියති.

* මුලින් දී ඇති පද වර්ගයන්ට උදාහරණයක් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

13. (1) උපසර්ග පද - ප්‍රබල, අතිරස, විදේශ, අනුනායක

(2) නිපාත පද - තෙක්, විසින්, ලවා, හෙට

(3) ක්‍රියා පද - ලියයි, නටත්, පනිමින්, දිනේවා

(4) යුගල පද - අතන මෙතන, එහා මෙහා, සැණකෙළි, උඩ බිම

14. (1) තද්ධිත පද - ඉසුරුමත්, නැණවත්, සිසිලස්, මාසික

(2) කෘදන්ත පද - නටන, මුලපුන, දූවීම, ලියන්නා

(3) ගෞරවාර්ථ පද - පියාණී, සිටාණෝ, ගංගාවෝ, පුතණු

(4) විශේෂණ පද - කහ මල, රතු පැන, හෙමින්, වේගයෙන්

15. "සසර වසන තුරු - නිවන් දකින තුරු" මෙහි ඉරි ඇඳි පදය වනුයේ,

(1) බහු අර්ථ පදයකි. (2) ක්‍රියා පදයකි. (3) ඡන්ද පදයකි. (4) උපසර්ග පදයකි.

* ප්‍රශ්න අංක 16 සිට 18 දක්වා පහත ගේය පද ඇසුරින් පිළිතුරු සපයන්න.

"රන් මලක් ලෙස දෙව් බඹුන් දෝතින් පිදූ මේ පින් බිමේ
පස් පිඩක් ගිලිහී නොයන්නට රන් වැටක් ඇත සිව් කොණේ
නෙත් පුරා එක හීනයේ මුළු ලෝකයා නිදනා රැයේ
ජාතියේ මුර දේවතා එළි රැ පුරා දැල් වී තියේ"

16. ඉහත නිර්මාණයෙන් මතුවන සාහිත්‍ය රසය කුමක් ද ?

(1) හාස්‍ය රසය (2) බීභත්ස්‍ය රසය (3) වීර රසය (4) කරුණා රසය

17. මෙහි සඳහන් නොවන වචනයක් වනුයේ,

(1) රන්මල ය. (2) මුරදේවතාවන් ය. (3) පස්පිඩක් ය. (4) පුන්සඳ ය.

18. පුණ්‍ය භූමිය උපමා කර ඇත්තේ කුමකට ද ?

(1) රන්මලකට (2) පස් පිඩකට (3) මුර දේවතාවන්ට (4) දෙව් බඹුන්ට

* නිවැරදි වාක්‍යය තෝරන්න.

19. (1) ළාළුවෝ වේදිකාවට පැමිණ අත්පුඩි ගැසූහ. (2) ප්‍රේක්ෂකයන් සතුටින් ඔල්වරසන් දුන්හ.

(3) ග්‍රාම සේවක විසින් අයදුම්පත් තිකුත් කෙරෙති. (4) ඕතොමෝ සෑම දිනක ම පාසලට පැමිණෙති.

* පහත සඳහන් ප්‍රස්තාව පිරුළෙන් ගම්‍යවන අදහස කුමක් ද ?

20. "දුවන මුවන් දැක නොදමන් නෙළු පලා"

(1) දුවන මුවන් අල්ලා ගැනීමට පලා ඉවත දැමීමයි.

(2) තමා සතු දේ තබාගෙන, දුර ඇති දෙයක් ලබා ගැනීමට යෑමයි.

(3) අවදානම් සහිත දෙයක් ලබා ගැනීමට, තමා සතු දේ විනාශ කිරීමයි.

(4) දුවන මුවන්ට, නෙළා ගත් පලා වර්ග ලබාදීමයි.

(ලකුණු 2×20 = 40)

REFERENCE ONLY

## II කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. ඔබ ශ්‍රවණය කළ ගුවන් විදුලි වැඩසටහනක් ආශ්‍රය කරගෙන පිළිතුරු සපයන්න.

1) ඔබ සවන් දුන් ගුවන් විදුලි වැඩසටහන කුමක් ද ?

2) ශ්‍රව්‍ය ගෝචර මාධ්‍යයකට පාදක වන අංග ලක්ෂණ දෙකක් ලියන්න.

3) ගුවන් විදුලි නිවේදකයෙකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

4) ශ්‍රවණය කළ වැඩසටහන තුළින් ඔබ ඉගෙනගත් කරුණු දෙකක් සඳහන් කරන්න.

5) වැඩසටහන ශ්‍රවණයේ දී මතු වූ ගැටලු දෙකක් ලියන්න.

(ලකුණු 2×5 = 10)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) වර්තමානයේ දී රූපවාහිනිය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි. ආධ්‍යාපනික වශයෙන් එහි ප්‍රයෝජනය විස්තර කරන්න. "රූපවාහිනිය හා ළමා පරපුර"

(ආ) "සිංහල භාෂාව ජීවී භාෂාවකි" බස රසවත් කර අදහස් ප්‍රකාශ කිරීමට එහි ඉඩකඩ එමටයි. ප්‍රස්තාව පිරුළු. ආප්තෝපදේශ හා රූඪී භාවිතයෙන් ඉහත අදහස වඩාත් සනාථ වෙයි.

(ඉ) "නිවැරදි පෝෂණයට හුරුවෙමු" ආහාර පාන ගැනීම, ව්‍යායාමය, නින්ද හා විවේකය, නිවැරදි ලෙස භාවිතයට හුරුවීම තුළින් නිරෝගී බව රැක ගැනීමට හැකිවෙයි.

(ඊ) දීර්ඝ කාලයක සිට ගම් ප්‍රදේශයේ පවතින නියඟය නිසා ගම්මුන්ට පමණක් නොව, සතා සිවුපාවුන්ට ද, ගස්වැල්වලට ද එය අහිතකර ලෙස බලපා ඇත. මේ පිළිබඳව ඔබත්, ප්‍රදේශවාසීනුත් මුහුණ දෙන අත්දැකීම් ඇසුරින් නිර්මාණාත්මක ප්‍රබන්ධයක් ගොඩනගන්න.

(ලකුණු 20)

03. රත්ගම සිට පහන්ගමට යන කෙටි මාර්ගය ප්‍රදේශ වාසීන්ගේ ආධාරය ඇතිව කොන්ක්‍රීට් කර ජනතා අයිතියට පත්කර දීම 2016 සැප්තැම්බර් 9 දින පෙ. ව. 9.30 ට සිදු කෙරේ. ප්‍රදේශය භාර ප්‍රාදේශීය ලේකම්තුමා මගින් එම මාර්ගය විවෘත කිරීමට නියමිත ය. රත්ගම ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතා, ප්‍රාදේශීය ලේකම්තුමාට යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

(ලකුණු 15)

04. පහත ප්‍රකාශ සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) "තාත්තාට දැන් විවේකයෙන් ඉන්න පුළුවන්, වයසට යනකොට විවේකය ඕනෑමයි."

(අ) මෙම පාඨය උපුටාගත් පාඩම කුමක් ද ?

(ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද ?

(2) "නුඹේ භාර්යාව කිකරු කරගෙන එක්ක යාම උඹට අයිති වැඩක්"

(අ) මේ පාඨය උපුටාගත් කෘතිය කුමක් ද ?

(ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කාට ද ?

(3) "පුතේ මං ඊයේ බොහෝම නරක හීනයක් දැක්කා"

(අ) මේ අවස්ථාව උපුටා ගත් පාඩම කුමක් ද ?

(ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවු ද ?

(4) "ඒ යෝදයා මොකද මෙහේ ? ඔහුට රැක්ම බල පොකුණය"

(අ) මෙම පාඨය උපුටාගත් පාඩම කුමක් ද ?

(ආ) මෙහි සඳහන් 'යෝදයා' කවු ද ?

(5) "<u>වනසර</u> දැක තම සිත බිය සලසා

<u>ගන ගැබ</u> ලෙළ දෙන විදුලිය විලසා"

(අ) මෙම පද්‍ය පාද ඇතුළත්වන කෘතිය කුමක් ද ?

(ආ) වනසර, ගනගැබ - යන පදවල අර්ථ ලියන්න.

(ලකුණු 2×5 = 10)

05. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2006 වසරේ සිට 2016 වසර දක්වා පිළිකාවට ගොදුරු වූ රෝගීන්ගේ ආහාර රටාව පිළිබඳව සිදුකරමින් පවතින සමීක්ෂණයකින් තහවුරු වී ඇත්තේ හරක්මස්, ඌරුමස්, එළුමස් වැනි රතු මාංශ නිතර අනුභව කරන්නන්ට මහා බඩවැලේ පිළිකා ඇතිවීමේ වැඩි අවදානමක් ඇති බව ය. සොසේජස්, ලිංගුස්, හැම් බේකන්, මීට් බෝල්ස් වැනි සකස් කළ ආහාර නිතර භාවිත කරන්නන් ද මහ බඩවැලේ පිළිකාව ඇතුළු පිළිකාවන් ට ගොදුරු වීමේ වැඩි ඉඩක් ඇති බව හඳුනා ගෙන තිබේ. වෛද්‍යවරුන් රෝගවල ට ප්‍රතිකාර කිරීම ට පරිබාහිරව පිළිකාව වැනි රෝගයක් ඇතිවීම ට බලපාන හේතු කවරේ ද ? යන්න මූලික වශයෙන්ම සොයාබැලීම ට අවශ්‍ය ය. රෝගී වූ කල රෝගය ට ප්‍රතිකාර කරනවාට වඩා, වෛද්‍යවරුන් කළ යුත්තේ, රෝගවල ට ගොදුරු නොවී සිටීමට අවශ්‍ය කරුණු සොයා, ඒ අනුව ජනතාව දැනුවත් කිරීමයි.

(1) ඡේදයෙන් අවධාරණය කෙරෙන ප්‍රමුඛ කාරණය කුමක් ද ?

(2) මෙහි විස්තර කෙරෙන අහිතකර ආහාරයක් නම් කරන්න.

(3) ශරීරයට අහිතකර සකස් කළ ආහාරයක් නම් කරන්න.

(4) වෛද්‍යවරයෙකුගේ මූලික කාර්යයක් ලෙස මෙහි සඳහන් වන්නේ කුමක් ද ?

(5) මිනිසාගේ ආහාර රටාව හා බෝ නොවන රෝග අතර සෘජු සම්බන්ධයක් පවතින බව ඡේදයෙන් අවධාරණය කෙරෙයි ද ?

(ලකුණු 1×5 = 5)